www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාව: පක්ෂ සාමාජිකයාගේ අතුරුදහන්වීම පිලිබඳ පරීක්ෂනයක් ඉල්ලීම සඳහා කැඳවන සසප රැස්වීම

**Sri Lanka: SEP public meeting to demand inquiry into party member's disappearance**

## 2007 මාර්තු 30

සමාජවාදී සමානතා පක්ෂය (සසප) තම සාමාජික නඩරාජා විමලේශ්වරන් සහ ඔහුගේ මිතුරු සිවනාදන් මදිවාදනන්ගේ අතුරුදහන් වීම පිලිබඳව හදිසි විමර්ශනයක් දියත් කරන ලෙස ශ්‍රී ලංකාවේ ආන්ඩුවෙන් සහ මිලිටරියෙන් ඉල්ලනු වස් අප්‍රේල් 9 වන දා කොලඹ දී ප්‍රසිද්ධ රැස්වීමක් කැඳවුම් කරයි.

සසප විශ්වාස කරනුයේ මෙම අතුරුදහන්වීම පිලිබඳව ජනාධිපති මහින්ද රාජපක්ෂ සහ ඔහුගේ ආන්ඩුව වග කිවයුතු බවයි. ජනාධිපති ධුරයේ වැඩ භාර ගැනීමන් අනතුරුව රුදුරු හදිසි නීති පියවරයන් බල ගන්වමින් සහ දිවයින පුරා ත්‍රස්ත සමයක් මුදා හරිමින් රාජපක්ෂ රට නැවත සිවිල් යුද්ධයට ඇද දැමුවේය. බහුලව සිදු කෙරෙන අතුරුදහන්වීම්, නීති විරෝධී ඝාතනයන් සහ ප්‍රචන්ඩ අපරාධ සම්බන්ධයෙන් ආරක්ෂක හමුදාවන්හි කවරෙකු හෝ වගකීම් භාර ගෙන නොමැත.

විමලේස්වරන් සහ මදිවාදනන් අතුරුදහන් වූයේ මාර්තු 22 වන දා සවස යාපනයේ උතුරු දිවයින් වලදී ය. එදින සවස 6.30 ට පමන පුන්ගුඩුතීව් දූපතත් ඔවුන් ජීවත් වූ කයිට්ස් දූපතත් යා කෙරෙන දිගු මුහුදු පාලම දෙසට පුන්ගුඩුතීව් දූපතේ සිට යතුරු පැදියකින් ඔවුන් ගමන් කරනු අවසන් වරට දැක ඇත. පුන්ගුඩුතීව් නාවික කඳවුරේ අන දෙන්නා ප්‍රකාශ කලේ මුහුදු පාලමේ ඔහුගේ පැත්තේ නාවික හමුදා මාර්ග බාධකය මෙම දෙදෙනා විසින් පසු කර ගිය බවයි. අනෙක් කෙලවරේ මාර්ග බාධකය භාරව සිටින කයිට්ස් නාවික කඳවුරේ අනදෙන්නා ප්‍රකාශ කරන්නේ ඔවුන් පිලිබඳව කිසිවක් නොදන්නා බවයි.

විමලේස්වරන් සහ මදිවාදනන් දෙවන සෝදිසි ස්ථානය පසුකර ගියේ නම් ඒ පිලිබඳව නාවික හමුදා සටහනක් තිබිය යුතුය. එවන් සටහනක් නොමැති නම් මෙම මාර්ග බාධකයන් දෙකෙන් කවරකදී හෝ ඔවුන් පැහැර ගත යුතු වන අතර එසේ නොවේනම් දෙවැන්නට ලගා වීමට ප්‍රථම ඔවුන් අතුරුදහන් විය යුතුය. මුහුදු පාලමමත් මිලිටරි පාලනය යටතේ පවත්නා තතු තුල ඔවුනගේ අතුරුදහන්වීමට එක්කෝ නාවික හමුදාව ඍජුව වග කිව යුතුය. අනෙක් අතට ඒ පිලිබඳව තොරතුරු නාවික හමුදාව දැන ගත යුතුය.

පසු ගිය වසර පුරා මිලිටරිය සහ එහි සහායක අර්ධ-මිලිටරි කන්ඩායම් මගින් මෙහෙයවනු ලබන ඝාතන කල්ලි විසින් දිවයිනේ උතුරේත් නැගෙනහිරත් සිය ගනන් දෙමල ජනයා මරා දැමීන, පැහැර ගැනින, නැතහොත් "අතුරුදහන්" කෙරින. තවදුර පවසතොත්, කයිට්ස් සහ අවට දූපත් වල සුවිසල් නාවික හමුදා බලකායක් රඳවා ඇති අතර ඔවුහු එම ප්‍රදේශයේ දෙමල ජනගහනයට හිරිහැර කිරීමට සහ බිය වැද්දීමට දක්ෂිනාංශික, ඊලාම් ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ (ඊපීඩීපී) අර්ධ මිලිටරි මැරයන් සමග සමීපව කටයුතු කරති.

සසප විසින් ආරක්ෂක අමාත්‍යංශයට, කයිට්ස් සහ පුන්ගුඩුතීව් නාවික කඳවුරු වලට සහ පොලීසියට කරන ලද විධිමත් පැමිනිලි තිබියදීම විමලේස්වරන් සහ මදිවාදනන් සිටිනා තැනක් සොයා ගැනීම සඳහා පොලීසිය හෝ මිලිටරිය මේ වනතෙක් කිසිවක් කල බවක් පෙනෙන්නට නොමැත .

අපගේ ප්‍රසිද්ධ රැස්වීමට සහභාගි වන ලෙසත් මිනිසුන් දෙදෙනා සිටිනා තැනක් සොයා ගනුවස් හදිසි පරීක්ෂනයක් පවත්වන ලෙස ඉල්ලා අප ගෙන යන උද්ඝෝෂනයට ආධාර කරන ලෙසත් සසප තම ආධාරකරුවන්ගෙන් සහ ශ්‍රී ලංකාව තුල සිටින ලෝක සමාජවාදී වෙබ් අඩවි පාඨකයින්ගෙන් ඉල්ලා සිටී.

**රැස්වීම පවත්වන ස්ථානය:**

**මහජන පුස්තකාල ශ්‍රවනාගාරය, කොලඹ**

**වේලාව: අප්‍රෙල් 09 දා සවස 4 ට**

© www.wsws.org